# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 516/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 24/03/2024 පැය 1900

**මාධ්‍ය නිවේදනය**

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් තිදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය සහ කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී.

- එම මෙහෙයුම් වලට සමගාමීව, 2024.03.24 වන අද දින දහවල් කාලයේදී මිනුවන්ගොඩ පොලිස් වසමේ පන්සිළුපුර ප්‍රදේශයේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිළධාරීන් කණ්ඩායමක් විසින් **සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු විදේශීය රටක නිෂ්පාදිත අත් බෝම්බයක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 720 ක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

  මෙම සැකකරු 2023.02.16 වන දින මිනුවන්ගොඩ පොලිස් වසමේ බොරගොඩවත්ත ප්‍රදේශයේදී පුද්ගලයෙකුට යතුරු පැදියකින් පැමිණ වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධියට සම්බන්ධ යතුරු පැදිය පැදවූ පැදිකරු බවට සිදුකල විමර්ශණයේදී අනාවරණය වී ඇත.

- 2024.03.24 වන අද දින උදෑසන කාලයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත කෙසෙල්වත්ත පොලිස් වසමේ ශාන්ත සෙබස්තියන් පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි

**සාමාජිකයෙකු කඩු 05 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 680 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන කෙසෙල්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සමඟ සම්බන්ධවී කෙසෙල්වත්ත ප්‍රදේශයේ ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයෙකු බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත.

**අත්අඩංගුවට ගත් කඩු 05 හි ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත එවමි.**

- 2024.03.24 වන අද දින දහවල් කාලයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැල්ලම්පිටිය පොලිස් වසමේ කොළොන්නාව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 190 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය සහ බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**